# පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 492

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

# பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : *492*

## மாவட்ட செயலகம், கேகாலை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் *119(4)* இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்கள் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் படிமுறைகளை பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

# *Parliamentary Series No – 492*

## *District Secretariat, Kegalle*

***Submission of observations of the Hon Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119 (4)***

## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක - 492

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

| කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කරගැනීමට ආයතනය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග / වර්තමාන තත්වය |
|---|---|
| සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබිණි. | නිල වාහන හැර සංචිත වාහන සියල්ල පිංතාරු කර ඇත. |
| මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ක් ඇතුළත නිරවුල් කර නොතිබිණි. | ජාතික උත්සව පැවැත්වීම වෙනුවෙන් නිකුත්කර ඇති අග්‍රිම වල බිල්පත් පළාත් සභාව වෙත යොමුකර, පියවීම් චෙක්පත් ලබා ගතයුතු වීම හා වෙනත් ප්‍රායෝගික දුෂ්කරතා නිසා මෙම ප්‍රමාදය 2023 වර්ෂයේදී සිදුව ඇති අතර, දුර්වලතාව හඳුනාගනිමින්, දෝෂ නිවැරදි කොට, මුදල් රෙගුලාසි අනුව මේ වන විට කටයුතු කරනු ලැබේ. |
| මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබිණි. | අවශ්‍යතාවය අනුව 2023 වර්ෂය තුල කමිටු රැස්වීම් හයක් පවත්වා ඇත.වර්ථමානය වන විට 03/2025 ස්වදේශ කටයුතු චක්‍ර ලේඛ ප්‍රකාරව කාර්තුවට එකක් වන සේ කමිටු රැස්වීම් පවත්වනු ලැබේ. |
| දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි. | අවශ්‍යතාවය පරිදි 2023 වර්ෂය තුල සමුළු හතරක් පවත්වා ඇත. වර්ථමානය වන විට මාසිකව රැස්වීම් පවත්වනු ලැබේ. |
| 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥාපණත අනුව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් මාසිකව පවත්වා නොතිබුණි. | අවශ්‍යතාවය පරිදි 2023 වර්ෂයතුල කමිටු රැස්වීම් පහක් පවත්වා ඇත.වර්ථමානය වන විට අවශ්‍ය පරිදි කමිටු රැස්වීම් පවත්වාගෙන යනු ලබයි. |
| දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | කමිටුව පැවැත්වීමට විශේෂ කරුණු නොමැති බැවින් වියදම් අවමකර ගැනීම සඳහා 2023 වර්ෂය තුල කාර්තුවකට එක බැගින් කමිටු රැස්වීම් පවත්වා ඇත. |
| දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි. | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ උපදෙස් අනුව යල කන්නය හා මහ කන්නයට අදාලව පොහොර කමිටු දෙකක් පවත්වා ඇත.වර්ථමානයේදි කන්න අනුව රැස්වීම් පවත්වන අතර විශේෂ හේතුන් පවතින අවස්ථා වලදී පමණක් අමතර රැස්වීම් පවත්වනු ලබයි. |
| දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු මාසිකව රැස් වී නොතිබුණි. | 2021.10.27 දින පැවති දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු රැස්වීමේදී ගන්නා ලද තීරණයක් පරිදි 2022 වරෂයේ සිට කාර්තුවකට එකක් වනසේ කමිටු රැස්වීම් පවත්වා ඇත. |
| ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / වයාචන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. | 2024 මැයි 21 දින යොමුකර ඇති 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා වන විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව අනුව ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බවට මතයක් ලබා දී ඇත. |
| ළමා අයිතිවාසිකම් පිළිබඳ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි. | පිළිගත නොහැක.කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 01/2018 චක්‍ර ලේඛය පරිදි වර්ෂයතුල කාර්තුවට එක බැගින් කමිටු රැස්වීම් පවත්වා ඇත.වර්ථමානයේදි නියමිත පරිදි රැස්වීම් පවත්වාගෙන යනු ලබයි. |

| | |
|---|---|
| සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවුණි. | සැලසුම්කර තිබූ පුහුණු අවස්ථා දහතුනෙන් අවස්ථානුකූලව ලැබුණු ඉල්ලීම් හා කාලීන පුහුණු අවශ්‍යතා පරිදි පුහුණු වැඩසටහන් නමයක් පවත්වා ඇත.වර්තමානය වන විට සැලසුම්ගත පුහුණු අවස්ථා ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යනු ලබයි. |
| දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයයන්ත මාස 02 කට වරක් රැස් වී නොතිබුණි. | කමිටු රැස්වීම් වාර පහක් පවත්වා ඇති අතර විශේෂ කරුණු නොමැති නිසා එක් රැස්වීමක් පවත්වා නොමැත. වර්ථමානයේදි නියමිත පරිදි රැස්වීම් පවත්වාගෙන යනු ලබයි. |
| තිරසර සංවර්ධන හා වන ජීවී අමාතයාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/3/16-2016 චක්‍රලේඛයේ උපදෙස් පරිදි වන අලිහානි හා වෙනත් වන සතුන්ගෙන් සිදුවන හානි පිළිබඳ වන්දි කමිටුව රැස් වී. නොතිබුණි. | මෙවැනි කමිටුවක් කැගල්ල දිස්ත්‍රික්කය තුල පිහිටුවා නොමැත. |

එස්.එන්.ජයසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
කෑගල්ල.

**එස්. එන්. ජයසිංහ**
**ප්‍රධාන ගණකාධිකාරී**
**කෑගල්ල දිස්ත්‍රික් ලේකම් වෙනුවට**

කේ.ජී.එස්.නිශාන්ත,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය.

කේ.ජී.එස්. නිශාන්ත
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය

## ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් පෞද්ගලික අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

එස්. ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2026 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළගා කර ගැනීමට අපේක්ෂා කරමි.

මහාචාර්ය ඒ.එච්.එම්.එච්.අබයරත්න (පා.ම.)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය

මහාචාර්ය ඒ.එච්.එම්.එච්. අබයරත්න
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍ය
නිදහස් චතුරස්‍රය - කොළඹ 07.